# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## මාධ්‍ය නිවේදනය

මහනුවර ප්‍රදේශයේ පසුගිය දිනවල ඇති වූ නොසන්සුන් තත්වය පදනම් කරගෙන ශ්‍රී ලංකාව තුල සමාජජාලා ප්‍රවේශය සීමා කිරීමක් සිදු වී ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුල සිදුවන මානව හිමිකම් උල්ලංඝනය පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැඩි අවධානයෙන් සහ අවධියෙන් කටයුතු කරන අතර එවන් අවස්ථා වලදී කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබෙන තෙක් නොසිට ඍජු මැදිහත් වීම මත පැමිණිලි විභාගයන් ගැටළු වල තිව්‍රතාවය අනුව ආරම්භ කිරීම සිදුකරනු ලැබේ.

ඉහත සිද්ධීන් ආශ්‍රිතව හා සමාජජාලා වෙත ප්‍රවේශ වීම සීමා කිරීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්ථාවර යැයි හැඟෙන ආකාරයේ ප්‍රවෘත්ති පලවීමක් කොමිෂන් සභාව නිරික්ෂනය කරනු ලැබීය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාධ්‍ය ප්‍රකාශක ලෙස ජනාධිපති නීතිඥ සාලිය පීරිස් කොමසාරිස්තුමා කටයුතු කරන අතර කොමිෂන් සභාවේ සියළුම නිල ප්‍රකාශණයන් www.hrcsl.lk අන්තර්ජාල පිටුව වෙතින් ලබාගත හැකිය.කොමිෂන් සභාවේ සත්‍ය ස්ථාවරය පිළිබඳ විමසීමට අවශ්‍ය නම් පහත දුරකථන ඔස්සේ තොරතුරු විමසිය හැකිය.

කොමසාරිස්තුමා ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා

011- 2505468/ 0777- 845567

නිහාල් චන්ද්‍රසිරි මහතා - පර්යේෂණ සහ විමර්ෂණ අංශයේ වැඩබලන අධ්‍යක්ෂ

011-2505565 / 077- 3255361

Udagama

සභාපතිනිය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2018/03/13

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka